සිසිර දිසානායක

බෙරේ කරේ

ශ්‍රී ලංකාවෙ කලබල කාලයක්. පින්සල කතාවකට මුලපිරුවා. පන්හිඳ කොම්පියුටරේ වෙබ් අඩවියක අමුණලා තිබුණ නැටුම් උත්සවයක පින්තූර බල බලයි උන්නෙ.

ගමේ කලායතනයේ ගොඩනැගිල්ල වෙන්කර ගන්න බැරි වුණාම කට්ටියම කඩා වදින්නෙ අපේ ගෙදරට්ට. ඒක ඉතිං අපේ තාත්තා ඉන්න දවස්වල ඉඳන්ම තිබුණ පුරුද්දක්. උන්නැහෙත් කලාකාරයානේ. එ ඇරෙන්න නංගිලා දෙන්නාමත් නැටුම් ඉගෙන ගත්තෙ කලායතනයෙන්. සුනිලා රූපස්වර නෝනයි ධනපාල ඕවිට්ටි ගෙදර මහත්තයයි තමා ඒ දවස්වල කලායතනයේ නැටුම් අංශේ කරගෙන ගියෙ. ලොක්කි නම් නටන්න ඉගෙන ගන්න පටන් ගත්තෙ සෝමපාල මුදුන්කොත්ගේ මහත්තයාගෙන්. මට මතකයි මීදුල පුරා මැණ්ඩියට ඉඳගෙන සරඹ එහෙම කරනවා. කොල්ලන්ට කෙල්ලන්ට අව්ව වැස්ස ගානක් නෑ බෙරේ තියාගන්න තැනක විතරයි ඕන. වැස්ස දට මීදුල මඩ වෙනකල්ම නැටුම්

පුහුණුව ඉවරවුණාම බෙර එහෙම තිබුණ තැන්වලට ගෙනිහින් දෙන්න වෙනවා. ඔය වාගෙ බර වැඩ වලට තමයි අපි අහුවෙන්නෙ. මඟ අර්න්නත් බෑ, ගමේ වැඩේනෙ.

ඔව් ඉතින් ගෑනු ළමයි හන්ද යන්නත් බෑනෙ. ඇඹලයා වාගෙ ඉන්න ඇති. පන් කොම්පියුටරේ නිවලා දැම්මා.

මොනවට කියනවද ඒ දවස්වල නංගිලාගෙ යාලුවන් ගැනයි, යාළුවන්ගෙ නංගිලා ගැනමයි හිත හිත ඉඳලා අන්තිමට ඒ මොකුත්ම නැති වුණා. පින් හිල්ලුවා.

ඉතිං ඔය කාලෙ ඇඳිරි නීතිය මහ ආණ්ඩුවෙන් නිතර නිතර දන කාලෙ. එදා ඇඳිරි නීතිය හවස හයට ඒ වෙලාවෙ වෙලාව හයට කාලයි.

අනෙ අයියේ මේ බෙරේ කලායතනෙට ගිහින් දීලා එනවද? ලොක්කිට කිව්වම අහන්නෙ නෑ යන්න වෙලාව මදි කියලා. දන්නෙ නැද්ද කෙල්ලන්ගේ අඬෝවැඩියාව?

දැනෙන විදියට ලියන්නං හැබැයි ඉතින් මං දන්න සිල්පයක් නං නෑ. පින් ලියන මේසෙට ගියා.

අපට ඉතින් තිරේ ඇරෙන කොටම පේන දේවනෙ හිත යන්නෙ. මැදු කොටස දර්ශන පෙන්නන ඉඩ තියලා දෙපැත්තෙන් පාතට වැටෙන්න කරලා තිබුණ වේදිකා සැරසිල්ල චාම් වුණත් එකපාරටම ඇස් ඇදලා ගත්තා. හප්. පසුතලයේ සුදුවෙන් ඇඳලා තිබුණ රේඛා මෝස්තරය හරියට අපේ පරන සිංහල ලියවලේ විදියට උඩ ඉඳන් පාතට එතිදිලා තිබුණා. ඒත් ලියවලේ පතු නැතිවයි රේඛා රටාව නිර්මාණය වෙලා තිබුනෙ. මේ පාරත් පුරුදු විදියටම ගාමිනි රණසිංහ මහත්තයයි සැරසිල්ල කරලා තිබුණේ. විශ්ව රංගන රේඛා ප්‍රසංගයේ රේඛා නිසාලු ඒ විදියට රේඛා නිර්මාණයක් කළේ. ලියවැල කාන්තා පක්ෂයට උපමා කරනවානෙ.

ලියවැල් රටාව ගන්න ඇත්තේ ඒ හින්දා වෙන්නැති. දෙපැත්තේ ඉහළින් ඉරයි හඳයි ඇඳලා තිබුණා. ඒත් අපේ සිංහල ක්‍රමයට.

නිවේදක කටයුතු වලට වේදිකාවට ආවෙ පැතුම් තිලකසිරි මහත්තයායි ඊප්ති පෙරේරා නෝනායි. තිලකසිරි මහත්තයාගේ කට හඬ මෙල්බර්න් වේදිකාවට අවශ්‍යම හඬක්. ගායනය කරන අයට වගේම නිවේදන කටයුතු කරන අයට හිත් ඇඳලා ගන්න හඬක් ඕනමයි. ඒක ඉතින් උප්පතියෙන්ම ලැබෙන දෙයක්. තිලකසිරි උන්නැහේ වගේම ඊප්ති නෝනාත් හොඳ සංයමයකින් ඒ වැඩේ කරගෙන ගියා.

උඩරට නැටුම් සම්ප්‍රදායට කරපු පූජා නැටුමයි මුලින්ම තිබුණෙ තිරයේ පෙනෙන්නට සළස්සපු සරස්වතී දේවියගේ පින්තූරයේ වැඩියෙන් තිබුන රෝස පාටයි දම්පාටයි ගලපලා නැටුමේ ඇඳුම් පිළියෙල කරලා තිබුණා. මුළු ප්‍රසංගයේදීම ඇඳුම්වල ගැලපීම බොහොම හොඳ මට්ටමක තිබුණා කියලයි හිතෙන්නෙ. වැඩීත් නෑ, අඩුත් නෑ, සමබරයි. ඒ වගේම නිර්මාණාත්මකයි. විශේෂයෙන්ම මයුරා වන්නමේදී මොණර පිල් කළඹ, උකුඩා වන්නමේදී තටුවල හැඩයට අතට එක්වුණ කොටස් නටන වෙලාවට ඒ ඒ සත්තුන්ගේ හැඩරුවට කියා පාන්න ලොකු රැකුලක් වුණා. ඇත්තටම ඒ වාගේ සාම්ප්‍රදායික නැටුම් අතරේදී තිරයේ ඒ කුරුල්ලන්ගේ රූප පෙන්නන්න ඕනෙ නෑ කියලයි හිතෙන්නෙ. නැටුමේ මුලදී -අගදී පෙන්නුවාට කමක් නෑ. මැදදී නැටුමටම අහැ බන්දවාගත්තනම් හොඳය කියලා හිතෙනවා. උරගා වන්නමේදී තිරයේ නාගයකුගේ රූපය පෙන්නපු එක නැටුමට කරපු අසාධාරණයක් . පෙන ගොබයේ හැඩේට අත්ලවල් තියාගෙන කරපු නැටුමේ අපට හුසුරු අංග එලන තිබුණා. ඒ වගේම උරගයෙකු බඩගාගෙන යනවා වගේ දකින් කරපු චලනය නියම රද්ම්යට කළාය කියලා හිතෙනවා. ඒවාට යොමු කරන්න තියෙන අවධානය තිරය පැත්තට ගියාවත්ද කියලා හිතුණා. " බට්ච්චියක් නටනෙයි "නැටුමේදීත් වෙදිකාවේ හුරතල් ගතිය තිරයට ආවාද කියලා හිතෙනවා. ඔය දර්ශන ටික ඇරෙන්න අනික් දර්ශන බොහෝම හොඳට නැටුමට ගැලපුණා." අපේ කාලේ වැද්දෝ " නැටුමේ පසුබිම් දර්ශන කොයි තරම් ගැලපුණාද කිව්වොත් අපිට දැනුනෙ වේදිකාවේ නටන අය ඉන්නේ ඒ දර්ශන තලයේම ඉන්නවා වගෙයි. වර්ෂාවට පසු අංගයේ දර්ශන නැටුම අභිබවලා ගියා වගෙයි. ඇඳුමත් වැස්සතට පස්සෙ ගහකොලවල තියෙන ප්‍රාණවත් බව පෙන්නන්න තිබුණා.

ඔය කිව්ව දේවල් ඇරෙන්න අනික් හැම වෙලාවකම ඇඳුම්ක්, දර්ශනත් හුඟක් දුරට ගැලපුණා. ඇත්තටම නැටුම කියන කලාව චිත්‍ර, සංගීතය දෙක එක්ක ගලපාගන්න අරන් තිබුණ උත්සාහය හරි අපූරුයි. ප්‍රසංගයේ ඇඳුම් නිර්මාණය කළේ රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියමයි. මේ හැම දෙයක්ම උද්දීපනය කරලා පෙන්නන්න එළිය අපූර එක එක පාට වලින් නිර්මාණය කරලා පෙන්නුවේ ජගත් කොතලාවල මහත්තයා. ශ්‍රී ලංකා ජාතික ගීය ගයන වෙලාවේ පවා තිබුණේ හරිම චමත්කාරයක්. ලොකු තිරය පිරෙන්න තිබුණ පාට පාට සිංහ කොඩිය ඉදිරිපිට රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියගේ ගෝල බාල කැල එක එක පාට ඇඳුම් ආයිත්තම් වලින් සැරසිලා ගීතය ගයද්දී කොතලාවල මහත්තයාගේ එලියෙන් ලැබුනේ පුදුම ආලෝකයක් ඒ වගේම නිර්මාණාත්මකව කරපු ඉදිරිපත් කිරීම් වලදීත් ඒ අඳුරෙන් නැටුමට ලැබුනෙ පුදුම ආලෝකයක්. විශේෂයෙන්ම එතා මෙතා පේන සුදු තිරය පිටිපස්සෙ ඉඳන් කරපු නැටුම් වලදි එළියෙන් ලැබුණ සහයෝගය අපූරුයි.

මේ වාගේ රටක, පරිසරයක අපට හැම දෙයක්ම සීයට සීයක්ම බලාපොරොත්තු වෙන්න බෑ. කොහොමත් අළුත් ළමයින් හැඩ වැටිලා එන්න ටික කාලයක් අභ්‍යාස කරන්න වෙනවා. "ඉරට මුවාවෙන් ගීතයට" තෝරාගත් දරුවන් ඒ වාගේ අඩු ලයේ ගීතයකට නටන්න කුඩා වැඩිද කියලා හිතුණා. ලයනල් රන්වල මහත්තයයි රොඩිනි වර්ණකුල මහත්තයයි ප්‍රසාංගිකව ඉදිරිපත් කරපු "ගොඩිනා බෝ දේ ලැබේ" ගීතයට නිර්මාණය කරපු ගීතය ගැමි නැටුම් ආරයට කරපු එකම අංගය වුණා. පින් තමන්ට පුලුවන් හැටියට ලිව්වා.

සාම්ප්‍රදායික නර්තනයට වඩාත් මුල්තැන් දුන් රසිකා කුලසිංහ නර්තනාචාර්යවරියගේ විශ්ව රංගායතනයේ "විශ්ව නර්තන රේඛා 2009" ප්‍රසංගය මෙවර වඩාත් වෙනස් මුහුණුවරක් ගෙන තිබිණ. පන් තමන්ගේ අදහස් එක් කරන්න පටන් ගත්තා.

ආනන්දයෙන් ඇරඹී ප්‍රඥාවෙන් පෙලවර වීය යුතු යැයි කියවෙන කලා මාධ්‍යයන්ගෙන් එකකි නර්තනය. අවස අප ලැබූ ප්‍රඥාවෙන්ම යුක්තව ප්‍රසංගය දෙස බැලීමේදී එහි වූ විවිධත්වය හා විශ්වනීය භාවය නිසාවෙන්ම එකී අවශ්‍යතාවය ඉටුවී ඇති බව පෙනී යයි. විවිධ නර්තන සම්ප්‍රදායයන් ඇසුරින් නිවේදකවරයා හරහා ප්‍රේක්ෂකයාට යම් දැනුම සම්භාරයක් සම්ප්‍රේෂනය කිරීමට නර්තනාචාර්යවරිය ගත් උත්සාහය ප්‍රශංශනීය වේ. නිවේදකවරයාද අන්තර්ජාල හා වෙනත් සම්පත් ඇසුරින් ඊට මුහුන් කරගත් දේ නර්තන අංගයෙන් අංගය අර්ථවත් කිරීමට බොහෝ සෙයින් ඉවහල් වූ බව නොකිව මනාය. විවිධ පරිසරවලින් එක්කරගන්නා ලද නර්තනයන් සංගීතවත් කළේ ඊට අදාල සංගීත බණ්ඩ සහ ගීතයන්ය.පසුබිම සැපයුවේ එකී පරිසර දර්ශන තලයි.

ඇති දැඩි කල මව් දෙමවුපියන්, ශිල්පය දුන් ගුරුවරුන් නමස්කාරය වැදගත් දෙයක්. ගුරුදෙගුරුන් වගේම කලාවට අධිපති සරස්වතිය අභිනන්දනය කළ පූජා නැටුමෙන් ඇරඹී ගලා ගිය නර්ථන රසෝඝයට පහත රට සම්ප්‍රදායේ "පතිනි සවිදම්" තාරුණ්‍යයේ චමත්කාරය කැටිකළ නීල නිමිනය නිර්මාණය, දරුවන්ගේ සුරතල් නැටුම් විලාශයන් කැටිකළ බට්ච්චියන් නටපෙයි, බටහිර රොක් ආරයේ කුඩා පිරිමි දරුවන්ගේ නර්තනය, වැඩි ගී ආරයේ අපේ කාලයේ වැද්දෝ, ගැමි ගී ආරයේ ගමේ ගොඩේ, හින්දි උන්මාදයෙන් උන්මාදිත නන්නාරේ අන්දරේගේ කවටකම් ඇසුරින් කුඩා දරුවන් කළ රංගනය, ස්පාඤ්ඤ ගීයකට අනුව කළ කපිරිඤ්ඤ නර්තනය, තේ දළු නෙලන්නියන්ගේ ද්‍රවිඩ ආරයේ නර්තනය, කෙළි ගී ඇසුරින් කළ කංකං බූරු වැනි අංග එක් වීය. උඩරට නර්තන සම්ප්‍රදායට අනුව කළ පූජා නැටුමට අමතරව වන්නම් කීපයක එකතුවක්ද කළින් සඳහන් කල උකුසා, උරගා සහ මයුරා වන්නම්ද වූ අතර වීශාරද නන්දා මාලනිය ගැයූ සීගිරි ජාවිත රාජ්‍යයේ සහ දේවදාසී ගීතත් පණ්ඩිත් අමරදේවයන් ගැයූ ඉරට මුවාවෙන් ගීතයත් නර්තනයන් ලෙසින් ඉදිරිපත් විණ. ප්‍රදීපා ධර්මදාස ශිල්පිනිය ගැයූ මේං අපේ ඉස්කෝලේ ගීයට ලංකාවේ බාලිකාවන් අඳින සුදු ගවුමෙන් හා කරපටියෙන් සැරසීගෙන කළ නර්තනය අපගේ මව්බිමේ ළමා විය සිහිපත් කරවමින් නෙතට කඳුලක් නැංවීය. පාසැලේ එදිනෙදා කටයුතු, කෙළි සෙල්ලම්, සරඹ ව්‍යායාමාදිය නර්තන විනාසයට නැංවූ අන්දම අපූරුයි. මෙම නර්තනය අප මුලින්ම වීන්දේ "තුන් සිතක ගී" ප්‍රසංගයේදීයි.

37 වන පිටුවට

> චිත්‍ර ශිල්පියෙකු, වයලීන වාදනය කරන නිරූපිකාවක හා සහාය වාද්‍ය නිරූපිකාවන් පිරිසක් මෙවලම් නොටගන්, නීල නිමිනයේ අංගය කලාවේ මූලිකාංග නූන වන චිත්‍ර, නැටුම්, සංගීනය මතු නොව අභිනය, රංගනය සහ ප්‍රසාංගිකන්වය එකට කැටි කළ නිර්මානයක් විය. මයුරා වන්නමට අනුව කළ මයුරාභිමානී නර්තනය මුලදී ගායනයෙන් මෙන්ම නර්තනයෙන්ද වන්නම් ස්වරූපයට වඩා වෙනස් මඟක් ගන්නේ අවසනදී නුවයෙන් සම්ප්‍රදායික නාදරටා හා නර්තන රටාවන්ට පිවිසියේය. වැදි නැටුම වෙනත් ගෝත්‍රික නැටුමකට හුරුවූයේ ඊට යා වූ බඹර නැපිල්ලට අනුගනව මියැවී ගැයුණ ගී රිද්මයටයි. එසේ වුවද ඒවා සම්ප්‍රදායේ සීමා දැන හැඳින කළ නිර්මාන විය. ආචාර්යවරියගේ මුහුකුරා ගිය බව ඉන් දෘෂ්‍යමාන විය.

අපොයි මං මොකැයි නොදන්නෙ ? ඒ පන්.

බැරිම තැන බෙරේ කරේ තියාන පිටත් වුණා. අතේ ඔරලෝසුවකුත් තිබුණා හොඳ වෙලාවට.

අතුවුණාද පොළිසියට? බෙරේත් පළලා බලන්න ඇති ගල් කටස් එහෙම තියෙනවද කියලා පන් උනන්දුයි පින්ගෙ කතාවට.

අනේ නෑ. මං වීනාඩ් හත හමාරක් තිස්සෙ ඇවිදලගෙන ගිහින් ආපහු හැරිලා ඉතිරි වීනාඩ් හත හමාරෙ ගෙදරට්ට ආවා බෙරෙත් අරන්. නැත්නං කන්කරච්චලෙන් බේරෙන්නයැ ?

හරි නීතිගරුක මනුස්සයා පන් කිව්වෙ ඔලොක්කුවට

නැත්නම් වෙඩි කන්නද කියන්නෙ ? පින් ඇහුවා.

ඔය වීදිනෙ වටපිටාවකුත් තියෙන එකේ රසිකා මිස්ලගෙ වැඩේ ගැන මොනව හරි ඔහේම ලියල දැම්මානං කේද හොඳ ? පන්, පින්ට තමුන්ගෙ වැඩේ පංගාත්තු කළා.